---

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 01 හි 71 ඡේදය ප්‍රකාරව රු.21,945,953 ක් වූ ඒකාබද්ධ ණය, ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන් කර හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදි නිවැරදි ලෙස වර්ගීකරණය කිරිමට කටයුතු කරමි. | ගිණුම් ප්‍රමිතිය අනුව ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන් කර හෙළිදරව් කල යුතුය. |
| (ආ) | සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 හි 141 (ආ), (ඇ), (ඈ),(ග) ඡේද පරිදි මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි මෙම ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරවු කිරිම් ඉදිරියේදි සිදුකරමි. | ගිණුම් ප්‍රමිතිය අනුව සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් 2015 මැයි - 2018 ජුලි කාල පරිච්ඡේදය තුල විවිධ පුද්ගලයන් සඳහා ගාස්තු අයකිරීමෙන් තොරව නේවාසිකාගාර පහසුකම් ලබාදී තිබුණු අතර ආදායම හඳුනාගැනීමට පත් කරන ලද කමිටුව විසින් 2019 වර්ෂයේදී ආයතනයට ලැබිය යුතු ලෙස හඳුනා ගෙන අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු රු.8,895,470 ක මුදලක් ආදායම් ලෙස ගිණුම් ගත කර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන හා කලමනාකරණ කමිටුව වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් රු.8,895,470 ආදායමක් ලෙස ගිණුම්ගත කිරිමට නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත. එම විගණන හා කලමනාකරණ කමිටුවේ නිර්දේශය අනුව මූල්‍ය ප්‍රකාශන වල සටහන් 1.8(iii) යටතේ හෙළිදරවු කර ඇත. | හඳුනාගෙන ඇති ආදායම් ගිණුම් ගත කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.695,429 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | වර්ෂයට අදාල වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ආයතනය විසින් ඉටු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති වෙනුවෙන් බාහිර ආයතනවලින් ලද ප්‍රත්‍යාගණිත වටිනාකම රු.4,256,390 ක් වූ ලැප්ටොප් පරිගණක, ටැබ්ලට් හා උපාංග අයිතම 103ක් ආයතනය විසින් භාවිතයට ගෙන තිබුණ ද, ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් මෙම තොරතුරු හෙළිදරවුකර ඇති අතර වටිනාකම් හා අයිතමයන් ලෙස වෙනවෙනම ප්‍රත්‍යාගණන වාර්තාව සමග අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කර ඇත. | ආයතනයට ලැබී භාවිතයට ගෙන ඇති වත්කම් වල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මිලට ගත් රු.1,804,500 ක් වටිනා වත්කම් 2023වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඒ සඳහා රු.302,350 ක් ක්ෂයවීම් ලෙස ද, ගිණුම් ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම වරද නිවැරදි කර නොතිබීම හේතුවෙන් ක්ෂය වෙන් කිරීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, සමුච්චිත අරමුදල අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පිලිගනිමි. වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ක්ෂය ගණනය කර තිබූ බැවින් එය නිවැරදි කිරිමට මෙම වර්ෂයේදි කටයුතු නොකල අතර ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය මෙම වර්ෂයේදි සංශෝධනය කරන ලදි. | නිවැරදිව වත්කම් හා ක්ෂය වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2025 වර්ෂයට අදාල රු.327,110 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුළ උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් ද ගෙවිය යුතු වියදම් එම වටිනාකමින් වැඩියෙන් ද දක්වා තිබුණි. | පිලිගනිමි. | වර්ෂයට අදාළ වියදම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | රු.2,971,456 ක් වටිනා ප්‍රකාශන පොත්වලින් විශාල ප්‍රමාණයක් නැවත භාවිතා කළ නොහැකි පරිදි විනාශ වී හෝ දුර්වර්ණ වී ඇති බව හඳුනා ගෙන තිබුණද අදාල පොත් තොගයෙන් ඉවත් කිරීමට හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය වෙන් කිරීම්, කිරීමෙන් තොරව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මේ වනවිටත් ඊට අදාල පියවර ගැනිමට කටයුතු කර ඇත. | භාවිතයට ගත නොහැකි පොත් තොගයෙන් ඉවත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.43,189,356 ක් වන අතර ඉන් විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂය රු.17,915,464 ක්ව තිබුණි. මෙම විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයෙන් රු.12,643,448 ක මුදලක් 2002 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වන අතර එම මුදල අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද 2021වර්ෂයේදී ආයතනයට නොදන්වා විශ්ව විද්‍යාලයක කථිකාචාර්ය තනතුරක් සඳහා ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.5,272,016ක මුදල අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතනය ක්‍රියාත්මක වන අතර මේ වන විට ඇපකර නොගෙවූ ශිෂ්‍යත්ව ලාභීන් 06කට අඩු වී ඇත්තේ ආයතනය විසින් පසුගිය වර්ෂ 05 දී ගනු ලැබූ ක්‍රියාමාර්ග බැවිනි. දැනට ඉතිරි වී ඇති නොගෙවූ ශිෂ්‍යත්ව ඇපකර 03ක්ම වර්තමාන ලිපිනයන් නොමැති නමුදු ආයතනය විසින් තවදුරටත් ඔවුන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව මෙයින් දැනුම් දෙමි. | ලැබිය යුතු මුදල් අදාළ පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු රු.2,158,880 ක ශේෂය වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වර්ෂ 05 වැඩි ණයහිමි ශේෂය රු. 2,324,342කි. එය නැවත ගෙවිය යුතු තැන්පතු, ආපනශාලා තැන්පතු, සේවයෙන් ඉවත් වූ සේවකයන් ගෙවිය යුතු මුදල, රඳවා ගත් තැන්පතු, ණයහිමියෝ, ගෙවිය යුතු පාරිතෝෂිත, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ව්‍යාපෘති වලට අදාළ ණයහිමි ශේෂය යනාදියෙන් සැකසි ඇත. | නිරවුල් කළ යුතු අය හඳුනාගෙන නිරවුල් කිරීම හෝ ආදායමට ගැනීම කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතෙහි 3 පරිච්ඡේදයේ 3.4 (ix) වගන්තිය | වැඩ බලන පත්වීමක් වසරක් නොඉක්මවන කාල සීමාවකට සීමා විය යුතු වුවත්, ආයතනයේ සේවය කරන නිලධාරින් 06 දෙනෙකුට වසර ගණනාවක සිට වැඩ බැලීමේ රාජකාරි වල නිරත වීම වෙනුවෙන් රු.2,063,343 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | එකී තනතුරු වලට සුදුස්සන් බඳවා ගන්නා තෙක් අදාල අනුමැතිය පාලක මණ්ඩලය වෙතින් ලබාගෙන ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව බඳවා ගැනීම් කිරීමට හෝ නිවැරදි සමාලෝචනයන් සිදුකර තනතුරු යටපත් කිරීම කළ යුතුය. |
| (ආ) | මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අංක මු.අ.01/2015/01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛයේ 7 (ආ) වගන්තිය | ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි වීනයේ පැවති පුහුණු වැඩ සටහනක් සඳහා 2024 නොවැම්බර් 01 සිට 14 දක්වා සහභාගී වීම වෙනුවෙන් අනියම් දීමනා සඳහා එක්සත් ජනපද ඩොලර් 375 ට සමාන රු.112,678ක අත්තිකාරම් මුදලක් දින 15ක කාලයක් සඳහා ගෙවා තිබුණි. මෙම වැඩසටහනට සහභාගී වීම වෙනුවෙන් වීන අනුග්‍රාහක ආයතනය විසින් දෛනික වියදම් සඳහා රු.84,000 කට සමාන යුවාන් 2,100 ක් ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇය හිමිකම් නොලබන රු.84,000ක මුදල දිවයිනට පැමිණ මසක් ඇතුළත ආයතනය වෙත ගෙවිය යුතු වුවත්, 403 දරන පාලක මණ්ඩල රැස්වීමේදී වාරික 36 කින් ගෙවීමට මෙම චක්‍රලේඛයට පටහැනිව අනුමැතිය ලබා දී තිබුණි. | පාලක මණ්ඩලයේ අනුමැතිය මත වසර 03ක් දක්වා කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී ඇත.කෙසේ නමුත් මින් ඉදිරියට කුමන හේතුවක් මත හෝ එවැනි සහන ලබා දීමට කටයුතු නොකරන බව ද සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 381(1) ප්‍රකාරව රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත්, ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම බැංකු ගිණුම් 04ක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අයතනය අරම්භයේ සිටම මෙම ජංගම ගිණුම් 04 පවතින බව වාර්ෂික ගිණුම් පරික්ෂා කිරිමේදි නිරික්ෂණය වේ.මෙම ගිණුම් 04 අරම්භ කිරිම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් අනුමැතිය පිලිබද ලිපිලේඛන සොයා ගැනිමට නොහැකිවි ඇත.මේ සම්බන්ධයෙන් ඉදිරියේදි මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගැනිමට කටයුතු කරමි. | අවශ්‍යතාවය නැවත සලකා බලා අනවශ්‍ය බැංකු ගිණුම් වසා දැමීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,199,158 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.16,128,359 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,929,201 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පාරිශ්‍රමික වියදම වැඩි වීම, වාහන අලුත්වැඩියා වියදම වැඩි වීම, සේවක සංවර්ධන වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේ දී රජයේ ප්‍රදාන සියයට 18.7කින් හා පර්යේෂණ හා පුහුණු සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන සියයට 10.7 කින් වැඩි වී තිබුණු අතර වෙනත් ආදායම් සියයට 19.6කින් හා පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා වෙනත් පාර්ශවයන්ගෙන් ලද අරමුදල් සියයට 43.2කින් අඩුවී තිබුණි. එසේම, පර්යේෂණ හා පුහුණු වියදම් සියයට 4 කින් හා වෙනත් පාර්ශවයන් සඳහා පර්යේෂණ හා පුහුණු වියදම් සියයට 43.2 කින් අඩුවී තිබුණු අතර සේවක පාරිශ්‍රමික වියදම සියයට 21.6කින් හා වෙනත් වියදම් සියයට 26.3කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 3.5කින් අඩු වී තිබුණු අතර, ජංගම අනුපාතය 0.72 කින් ද, ක්ෂණික වත්කම් අනුපාතය 0.71කින් ද වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සඳහා 2019 මැයි 27 දින 228 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණද, තනතුරු 13 කට අදාල කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගෙන නොතිබුණි. | නව කාර්ය මණ්ඩල ඇස්තමේන්තුවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එම කාර්ය මණ්ඩල ඇස්තමේන්තුව ලැබුණු විගස නව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් කඩිනමින් අනුමත කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනුමත තනතුරු සඳහා වාර්ෂිකව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත්, ආයතනය විසින් 2019 වර්ෂයෙන් පසුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. | වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවය අනුව පැවැත්වීමට ඉදිරියේ දී කඩිනමින් කටයුතු කරනු ලැබේ. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතුය. |

**3.2 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක ආහාර සංවිධානයෙන් 1984 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලද රු.600,000 ක් වූ ලොරි රථය ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයතනය වෙත පවරා ගෙන නොතිබුණි. | 40- 3933 ආයතනය වෙත පවරා ගැනීම සඳහා ලෝක ආහාර සංවිධානය වෙත ඉල්ලීම් කර ඇත. එම ආයතනය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත යොමු කර ඇත. | රථය පවරා ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව රු. 13,130,000 ක් ඇස්තමේන්තු කර පර්යේෂණ 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර සමාලෝචිත වර්ෂයේදි රු.11,610,000 ක් වැය කර පර්යේෂණ 11 ක් ද, 2025 වර්ෂයේ දී පර්යේෂණ 02 ක් ද නිම කිරීමට අපේක්ෂා කර ඇතත්, වර්ෂය තුළ එක් පර්යේෂණයක් පමණක් අවසන් කර තිබුණි.ඒ අනුව, පර්යේෂණ ව්‍යාපෘතීන් අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 9 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි තවද 2023 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 06 ක් 2025 ජුනි 30 වන විටද අවසන් කර නොතිබුණි. ඒ සඳහා ආයතනය රු.7,460,000 ක් වියදම් දරා තිබුණි. | විගණනයේ දක්වා ඇති 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 16 න් ව්‍යාපෘති 04 මේ වන විට අවසාන කොට ඇත. | පර්යේෂණ නියමිත කාලය තුළ නිමකර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනය විසින් වර්ෂය තුළ දී සිදු කල පර්යේෂණයන් පර්යේෂණ හා පුහුණු කමිටු අනුමැතියකින් තොරව ක්‍රියාකාරී සැලැස්මට පර්යේෂණ මාතෘකා ඇතුළත් කිරීම හේතුවෙන් පර්යේෂණ මාතෘකා 02ක් ප්‍රතික්ෂේපවීම, පර්යේෂණ යෝජනාවන් 02ක් විෂය පථය වෙනස් කර නව යෝජනාවක් ලෙස අනුමත වීම, අයවැයගත වියදම් වෙනස් වීම් වලට ලක් වීම, පර්යේෂණ හා පුහුණු කමිටු අනුමැතිය ලද පසු නැවතත් ක්‍රියාකාරී සැලැස්ම | වර්ෂය තුළ සිදුකරනු ලබන පර්යේෂණයන් වෙනුවෙන් වූ පර්යේෂණ යෝජනාවන් "පර්යේෂණ හා පුහුණු කමිටුව (RTC)" වෙත ඉදිරිපත් කිරීමට පෙර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම හේතුවෙන් විගණනයෙන් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් මතුවන බව | අනුමත පර්යේෂණ යෝජනා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංශෝධනය වීම, ව්‍යාපෘතීන් අදාළ කාලය තුළ අවසන් කිරීමට නොහැකි වීම සහ පර්යේෂණයකින් සමාජයට ලබා දිය යුතු අවසන් ප්‍රතිඵලය අදාළ කාල පරිච්ඡේදය තුළ අදාළ පාර්ශවයන් වෙත සම්ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි. | පිළිගනිමි.ඒ අනුව 2026 වර්ෂයේ සිට පර්යේෂණ යෝජනා (RTC) කමිටුවට ඉදිරිපත් කර කමිටුවේ නිර්දේශ අනුව නැවත පිළියෙල කොට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට එකඟ වෙමි. | |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි “තොරතුරු හා සන්නිවේදන” ව්‍යාපෘතියෙහි ඇතුළත් සම්මන්ත්‍රණ, වැඩමුළු, ප්‍රසිද්ධ දේශන පැවැත්වීම සහ ආයතන ප්‍රකාශන ඉදිරිපත් කිරීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට භෞතිකව සියයට 50 ක් පමණක් ඉටු කර තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත දැනුම බෙදා දීම වෙනුවෙන් සංවිධානය වූ “Research Forum” සහ තවත් එක් සම්මන්ත්‍රණයක් පමණක් සිදුකොට තිබුණි. එලෙසට ප්‍රකාශන වෙනුවෙන් වූ ප්‍රගතිය අඩුවීමට 2023 වර්ෂයේ පර්යේෂණ අවසන් නොකිරීම හේතු විය. ප්‍රකාශන එළි දැක්වීම ප්‍රමාද වීමට තොරතුරු හා සන්නිවේදන අංශයේ නිලධාරින්ගේ හිඟය ද හේතු විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් යටතේ “කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන” දිස්ත්‍රික්ක 4ක පළමු හා දෙවන අදියරයන් ලෙස වැඩසටහන් 26 ක් ක්‍රියාත්මක කිරීමට රු.1,400,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ඒ අනුව පළමු අදියර යටතේ මොණරාගල හා කෑගල්ල යන දිස්ත්‍රික්ක දෙකෙහි වැඩසටහන් 20ක් සඳහා රු.1,200,000ක මුදලක් ද, දෙවන අදියර යටතේ පොළොන්නරුව හා මාතලේ දිස්ත්‍රික්ක දෙකෙහි වැඩසටහන් 6ක් ක්‍රියාත්මක කිරීමට රු.200,000ක මුදලක් ද ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව, පළමු අදියර යටතේ ගම්පහ, රත්නපුර හා මහනුවර දිස්ත්‍රික්ක 3හි රු.980,000ක් වැය කර වැඩසටහන් 3ක් ද, දෙවන අදියර යටතේ රු.190,000ක් වැය කර මාතලේ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 4ක් ද පවත්වා තිබුණි. වැඩසටහන් අවශ්‍යා කණ්ඩායම හඳුනාගැනීමෙන් තොරව සිදුකිරීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය කරා ලභාවීමට නොහැකි වී තිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඉටුකිරීමට අපේක්ෂිත වැඩසටහන් වෙනස්කර තිබුණි. | කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම යන තේමාව යටතේ 2024 වසර සඳහා දෙවන අදියරේ වැඩසටහන් 06ක් සැලසුම් කර තිබූ අතර, ඉන් මාතලේ සඳහා අවශ්‍යතාවය මත පදනම්ව වැඩසටහන් 04ක් පවත්වන ලදී. නමුත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2023 පැවැත් වූ පළමු අදියරේ වැඩසටහන් හි ප්‍රතිලාභීන් අතරින් දෙවන අදියර සඳහා සම්බන්ධ කරගත හැකි ව්‍යවසායකයින් ප්‍රමාණය ඉතා සීමිත බව හඳුනා ගැනිණ. වැඩසටහන් සැලැස්ම සහ වැය ඇස්තමේන්තුව සංශෝධනය කර අනුමැතිය ලබා ගැනීම 2024 අවසන් කාර්තුව ආරම්භයේ දී සිදුකළ බැවින් 2024 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. | ආයතනයේ අරමුණුවලට ගැලපෙන ලෙස වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |